දිනමිණ සිළුමිණ
The Silumina
epaper

# ජාතික ලුණු සමාගම

## මුදල්, ආර්ථික ස්ථායිකරණය හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

**ජාතික ලුණු සමාගම, මුදල්, ආර්ථික ස්ථායිකරණය හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂය පථය යටතේ පවතින රජය සතු සමාගමකි. කොළඹ ප්‍රධාන කාර්යාලයේ ස්ථිර පදනම මත සේවය කිරීම සඳහා පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

## අභ්‍යන්තර විගණක - (MM 1-1)

**(තනතුරු - 01 ප්‍රධාන කාර්යාලය)**

### අවශ්‍ය සුදුසුකම්

**බාහිර අපේක්ෂකයින්**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වාණිජ/ ගණකාධිකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් සමග උපාධිය ලබාගැනීමෙන් පසුව රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක (1) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

02. පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළ වන මධ්‍යම විභාගය සමත්වී තිබීම සමග තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

01. ඉහත බාහිර අපේක්ෂකයන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම

හෝ

02. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කනිෂ්ඨ කළමනාකාර (JM) කාණ්ඩයේ තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** MM1-1-GR11-2016 රු. (53,175-10X1,375-15X1,910-95,575) සහ අනෙකුත් රජය අනුමත කළ දීමනා.

**වයස** : අවුරුදු 22 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 45 ට වැඩි නොවිය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

- මෙම පත්වීම සම්බන්ධයෙන් අවසාන තීරණය ගැනීමේ අයිතිය අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
- පරිවාස කාලය වසර තුනකි.
- ඕනෑම බලපෑමක් කිරීම අයදුම්කරු නුසුදුස්සෙක් කිරීමට මුල පුරයි.

කරුණාකර ඔබේ ජීව දත්ත, සහතිකවල පිටපත් සමග 2024-02-19 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතුය. අයදුම්කරන තනතුර කවරයේ වම්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.

**සාමාන්‍යාධිකාරී,**
**ජාතික ලුණු සමාගම,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**
**011-2368974.**